# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය

## Trade National Single Window System (TNSWS) Project

# රැකියා පුරප්පාඩු නිවේදනය

# තොරතුරු තාක්ෂණ විශේෂඥ - I තනතුර

දේශසීමා මායිම් හරහා සිදුවන වෙළඳ කටයුතුවල (ආනයන, අපනයන හා ප්‍රතිනැව්ගත කිරීම්) නිරත වෙළඳුන් විසින් ඉදිරිපත් කිරීමට අවශ්‍ය සියලු ලේඛන තනි කවුළුවකින් ඉදිරිපත් කිරීමට සහ එමගින් ස්වයංක්‍රීය ලෙස ප්‍රතිඵල ද ලබාදීමට හැකිවන පරිදි සියලු නියාමන පියවර සහ නියෝජිතායතන අන්‍යෝන්‍ය වශයෙන් සබැඳි වේදිකාවකට ගෙන එමින් ජාත්‍යන්තර වෙළඳ ප්‍රවාහ සඳහා පහසුකම් සැලසීම සඳහා ජාතික ප්‍රමුඛතා ව්‍යාපෘතියක් ලෙස, එකී කාර්යය උදෙසාම වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් (Project Implementation Unit) හරහා වෙළඳ ජාතික තනි කවුළු පද්ධතියක් ස්ථාපනය කිරීමට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ඊට අදාළ කටයුතුවල නිරතවෙමින් පවතී. ඒ අනුව, වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතියේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ **තොරතුරු තාක්ෂණ විශේෂඥ - I තනතුර** සඳහා වඩාත්ම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් භාරගනු ලැබේ.

### සුදුසුකම්

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය හෝ මෘදුකාංග ඉංජිනේරු හෝ අදාළ ක්ෂේත්‍රයක මූලික උපාධියක්; **හෝ**

  අදාළ ක්ෂේත්‍රය පිළිබඳ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්;
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් වඩාත් පිළිගැනේ; **සහ**
- මහා පරිමාණ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පද්ධතිවලට අදාළව අවම වශයෙන් වසර 09ක පළපුරුද්ද, සහ එයින් අවම වශයෙන් වසර 04ක් කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම.

### පොදු කොන්දේසි

- 2025.09.21 වන දිනට වයස අවුරුදු 55 නොඉක්මවිය යුතු ය.
- වාර්ෂික කාර්යසාධන ඇගයුම මත පදනම්ව වාර්ෂිකව කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමට යටත්ව, මාස 23ක කාල සීමාවක් සඳහා අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනමින් බඳවාගනු ලැබේ.
- 2025.09.21 වන දිනට හෝ ඊට පෙර අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරාලිය යුතු ය.
- පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සතු ය.
- මෙහි සඳහන් නොවන හෝ බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ පැන නගින යම් ගැටලුවක් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් හා එකම තීරණය වේ.
- මෙම පත්කිරීම 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 සඳහන් වැටුප් මට්ටම් කාණ්ඩ PS 2 යටතේ සිදු කෙරේ.
- වැටුප සම්බන්ධයෙන් සාකච්ඡා කර එකඟතාවයකට එළඹිය හැකි අතර වැටුප් මට්ටම් කාණ්ඩ PS 2 සඳහා වන අනෙකුත් දීමනා හා ප්‍රතිලාභ 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 සඳහන් පරිදි ගෙවනු ලැබේ.

### අයදුම්කිරීමේ ක්‍රමවේදය

අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික, සේවා පළපුරුද්ද, සහ ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපත් සහ ඥාතීන් නොවන තමා පිළිබඳ විස්තර ලබාගත හැකි පුද්ගලයන් දෙදෙනෙකු සම්බන්ධ කරගත හැකි දුරකථන අංක සමඟින් විස්තරාත්මක ජීව දත්ත පත්‍රිකාවක් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විසින් 2025.10.04 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැල හරහා පහත ලිපිනයට ලැබෙන පරිදි එවිය යුතු ය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.

**ලිපිනය:**

**අධ්‍යක්ෂ ජනරාල්,**<br>**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව,**<br>**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,**<br>**මහ ලේකම් කාර්යාලය, කොළඹ 01.**

### බඳවාගැනීමේ ක්‍රමවේදය

කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර අසම්පූර්ණ ජීව දත්ත පත්‍රිකා ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය සියලු ලේඛන ඉදිරිපත් නොකිරීම නොසුදුසුවීම සඳහා හේතුවක් වනු ඇත.

රැකියා විස්තරය ද ඇතුළුව වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර https://www.treasury.gov.lk/web/ministry-of-finance-vacancies යන වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**ලේකම්,**<br>**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,**<br>**මහ ලේකම් කාර්යාලය, කොළඹ 01.**

**දිනය: 2025.09.21**